**මොරවැව ප්‍රාදේශීය සභාව - 2023**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මොරවැව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මොරවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය

හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020, 2021, 2022 වර්ෂ වෙනුවෙන් පිළිවෙලින් 13,800, 24,600 ක් හා 59,400 ක් වශයෙන් හා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණන ගාස්තු වෙන් කිරීම් කර නොතිබුණි. | පිළිගනිමි. 2024 ගිණුම් සකස් කිරීමේදී විගණන ගාස්තු වෙනුවෙන් වෙන් කිරීමට කටයුතු කරන බව | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී ලෝක බැංකු ආධාර යටතේ පරිත්‍යාග ලෙස ලැබුණ රු.5,900,000 ක් වටිනා RO plant එකක් ගිණුම්වලට ගෙන නොතිබුණි. | පිළිගනිමි. 2024 ගිණුම් සකස් කිරීමේදී අදාල ගැලපීම් කිරීමට කටයුතු කරන බව | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඇ) | අවස්ථා 04 කදී රු.511,600 ක් වැයකර මිලදී ගෙන තිබූ භාණ්ඩ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | පිළිගනිමි. 2023 අවසන් ගිණුම් සකස් කිරීමේදී මෙම තොරතුරු මගහැරී ඇත. ඉදිරියේදී නිවැරදි කරන බව | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඈ) | වටිනාකම රු.662,475 ක් වූ ගබඩාවේ ඉතිරි තොග ගිණුම්වලට ගෙන නොතිබුණි. | පිළිගනිමි. 2023 අවසන් ගිණුම් සකස් කිරීමේදී මෙම තොරතුරු මගහැරී ඇති බැවින් ඉදිරියේදී නිවැරදි කරන බව | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |

### 1.6.2 අවිනිශ්චිත ගිණුම්

| විෂය | මුදල<br>රු. | අවිනිශ්චිත ලෙස තිබූ කාලය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අවිනිශ්චිත ගිණුම | 7,864,759 | 2011 වර්ෂයේ සිට | පිළිතුරු ලබා දී නොමැත. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ඉඩම් හා ගොඩනැගිලි | 62,490,213 | ඉඩම් බලපත්‍ර හෝ ඔප්පු, මිනින්දෝරු සැලසුම් | මේ වන විට තොරතුරු එක් රැස් කරමින් පවතින අතර 2024 මූලික ගිණුම් වාර්තා සකස්කරන විට සම්පූර්ණ තොරතුරු ලබා දෙන බව | ගිණුම් විෂයයන්ට අදාළ නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | මෝටර් රථ හා ගරාජ් | 51,305,881 | ස්ථාවර වත්කම් ලේඛනය | - එම - | - එම - |
| (ඇ) | ලී බඩු සවිකිරීම් උපකරණ | 2,167,079 | - එම - | - එම - | - එම - |
| (ඈ) | තොගය | 216,165 | තොග ආගණන වාර්තා | - එම - | - එම - |
| (ඉ) | අත්තිකාරම් ගෙවීම් | 1,826,036 | කාල විශ්ලේෂණය හා කේවල ශේෂ ලැයිස්තුව | - එම - | - එම - |
| (ඊ) | ආදායම් ණය ගැතියෝ | 6,016,297 | ණය ගැති ලේඛනය,කාල විශ්ලේෂණය | - එම - | - එම - |
| (උ) | වියදම් ණය හිමියෝ | 3,689,700 | කේවල ශේෂ ලැයිස්තුව, කාල විශ්ලේෂණය | - එම - | - එම - |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති. රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) | 24 වගන්තිය | සභාව සතු මාර්ග සියල්ල හඳුනාගෙන ඉන්වෙන්ට්‍රිගත කිරීමට හෝ ගැසට් පත්‍රයේ පළ කිරීමටත් කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | පවත්නා සියලු මාර්ග ඉන්වෙන්ට්‍රිගත කර ගැසට් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 126 වගන්තිය | සභාව තුළ නව ආදායම් උත්පාදන කළ හැකි පරිදි අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව කටයුතු කළ යුතුය. |
| (iii) | 134 වගන්තිය | සභාවේ බල ප්‍රදේශය තුළ පිහිටි දියුණු ප්‍රදේශ නිශ්චිතව කලින් කලට හඳුනාගෙන වරිපනම් හා බදු පැනවීමට කටයුතු කර නොතිබුණි. | දියුණු කළ ප්‍රදේශ 3 ක් හඳුනාගෙන ඇත. ඒවා ගැසට් කර වරිපනම් අයකිරීමට සැලසුම් කර ඇති බව | ප්‍රාදේශීය සභා පනතේ විධි විධාන අනුව කටයුතු කළ යුතුය. |
| (iv) | 159 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.2,245,703 ක හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් වලින් කොටසක් මේ වන විටත් අයකර ගෙන ඇත. ඉතිරි කොටස අයකරගැනීමට අවශ්‍ය කටයුතු කරන බව | - එම - |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | ගිණුම් සමඟ ඉදිරිපත් කළ යුතු කාර්යසාධන වාර්තා ගණන්දීමේ නිලධාරියා විසින් ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ජාතික විගණන පනතේ විධි විධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 02/2018 චක්‍රලේඛය | චක්‍රලේඛ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට හා කාර්යසාධන ගිවිසුම්වලට එළඹීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | චක්‍රලේඛ විධි විධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1980 අංක 47 දරණ ජාතික පරිසර පතන හා 2008 පෙබරවාරි 25 දිනැති අංක 1533/16 දරණ ගැසට් පත්‍රයේ විධිවිධාන | වලංගු පරිසර බලපත්‍රයක් නොමැතිව ව්‍යාපාර පවත්වාගෙන යන අවස්ථා පැවතුණි. | පරිසර බලපත්‍ර ලබාගෙන නොමැති ව්‍යාපාර හඳුනාගෙන අදාල බලපත්‍ර නික්තු කිරීමට කටයුතු කරන බව | පනත් හා ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |
| (ඉ) | අධිකරණ අමත්‍යාංශයේ ලේකම්ගේ අංක 04/1994 හා 1994 පෙබරවාරි 18 දිනැති චක්‍රලේඛය | සෑම මාණ්ඩලික නිලධාරියෙකු විසින් වාර්ෂිකව තම වත්කම් බැරකම් ප්‍රකාශ කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂය සඳහා අදාල ප්‍රකාශ ලබාදීමට කටයුතු කරන බව | චක්‍රලේඛ විධි විධාන අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.176,105 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන ආදායම ඉක්ම වූ වියදම රු.280,387 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| -------- | ------------ | --------- | ------ | --------- | ----------- | -------- | -------- | --------- |
| කුලී | 6,200 | 3,862 | 3,836 | 495 | 5,100 | 2,882 | 3,193 | 469 |
| බලපත්‍ර ගාස්තු | 425 | 243 | 244 | - | 250 | 1,115 | 1,128 | - |
| වෙනත් ආදායම් | - | 1,366 | 1,002 | 364 | - | - | - | - |
| **එකතුව** | **6,625** | **5,471** | **5,082** | **859** | **5,350** | **3,997** | **4,321** | **469** |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා බල ප්‍රදේශය තුළ පිහිටි ප්‍රදේශ නිශ්චිතව කලින් කලට හඳුනාගෙන වරිපනම් හා බදු පැනවීමට කටයුතු නොකිරීම නිසා සභාවේ ආදායම් පහත වැටී තිබුණි. | දියුණු කළ ප්‍රදේශ 3 ක් හඳුනාගෙන ඇත. ඒවා ගැසට් කර වරිපණම් අයකිරීමට සැලසුම් කරන බව | ආදායම් වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **කුලී** | | |
| i. | සමාලෝචිත වර්ෂය අවසානයට රු.198,138 ක් වූ කඩකාමර කුලී හිඟව පැවති අතර ඉන් රු.58,336 ක් පෙර වර්ෂය වෙනුවෙන් අයවිය යුතුව පැවතුණි. | හිඟ කුළී ආදායම් වලින් කොටසක් මේ වන විටත් අයකර ගෙන ඇත. ඉතිරි කොටස අයකරගැනීමට අවශ්‍ය කටයුතු කරන බව | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| ii. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟව පැවැති වාහන කුලී රු.299,650 ක් වූ අතර එයින් රු.287,780 ක වාහන කුලී වසර ගණනාවක සිට පැවත එන හිඟයක් විය. | හිඟ කුළී ආදායම් වලින් කොටසක් මේ වන විටත් අයකර ගෙන ඇත. ඉතිරි කොටස අයකරගැනීමට අවශ්‍ය කටයුතු කරන බව | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාව විසින් වෙනත් නව ආදායම් මාර්ග හඳුනාගෙන ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි. උදාහරණ ලෙස බල ප්‍රදේශයේ ඇති සම්ප්‍රේෂණ කුළුණු, ත්‍රීරෝද රථ ගාල් සඳහා ගාස්තු නියම කර අයකිරීමට කටයුතු කර නොතිබුණි. | නව ආදායම් ප්‍රභවයන් කිහිපයක් හඳුනාගෙන ඇති අතර ත්‍රී රෝද රථ ගාල් ලියාපදිංචි කිරීම ආරම්භ කිරීමට කටයුතු කරන බව | ආදායම් වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කායර්සාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව ප්‍රධාන කාරණා 28 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කරන බව | විධිමත් පරිදි අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුය. |

### 3.2 මෙහෙයුම් අකායර්ක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දේශීය ණය සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් ණය මුදලට හිමි වාරික ගෙවීම ප්‍රවර්ථන වර්ෂයේදීද සිදුකර නොතිබුණි. එම නිසා ගෙවිය යුතු ණය ශේෂ රු.3,300,000 ක් ලෙස දක්වා තිබුණි. | සැලසුම් කළ පරිදි ආදායම් නොලැබීම නිසා අදාල ණය වාරික ගෙවිය නොහැකි වූ අතර මේ වසරේදී හිඟ ණය ශේෂයෙන් කොටසක් ගෙවීමට කටයුතු කරන බව | මනා මූල්‍ය කළමනාකරණයක් පවත්වාගත යුතුය. |
| (ආ) | 2017 වර්ෂයේදී රු.1,826,485 ක් අත්තිකාරම් ලෙස ලබාදී තිබූ අතර එම අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | අත්තිකාරම් සම්බන්ධයෙන් මනා පාලනයක් පවත්වා ගත යුතුය. |

## 3.3 නිශ්කාශ හෝ ඌණ උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේදී රු.16,695,000 ක් පිරිවැය වූ JCB යන්ත්‍රය දැනට වසර 05 ක පමණ කාලයක සිට අක්‍රියව පැවතුණි. | අදාල රථය අලුත්වැඩියා කිරීම සඳහා විශාල මුදලක් වැය වන නිසාත් සභාව සතුව එවැනි විශාල මුදලක් නොමැති නිසාත් මෙම තත්ත්වය පැවති බව | වත්කම් කළමනාකරණය විධිමත් කළ යුතුය. |
| (ආ) | අංක 02/2017 2017 දෙසැම්බර් 21 දිනැති වත්කම් කළමනාකරණ ව්‍යාපෘති මඟින් ලැබුණ වාහන 02 ක් හා ටේලර් 02 ක් ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන 02 ක් පමණක් පවරා ගැනීමට කටයුතු කරන බව | වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රුපියල් මිලියන 10 කට ඇස්තමේන්තු කර ඉදිකර තිබූ මාර්කට් ගොඩනැගිල්ල මුලින් තෝරාගත් කොන්ත්‍රාත්කරුට රු.1,764,413 ක් ගෙවීම් කර තිබූ අතර මිල විචලනයක් සඳහා ඉල්ලුම් කළද එම මිල විචලනයන් ලබා නොදීම හේතුවෙන් මුල් කොන්ත්‍රාත්කරු එම ඉදිකිරීමෙන් ඉවත් වී තිබුණි. පසුව වෙනත් කොන්ත්‍රාත්කරුවකුට මෙම ඉදිකිරීම භාර දී තිබූ නමුත් ගෙවීම් කිරීමේදී Joint Messerment ලබා ගෙන නොතිබුණි. මෙය Standard Building Documents වලට පටහැනි විය. | අදාල කටයුතු ව්‍යාපෘතිභාර ඉංජිනේරුවරයාගේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදු කරන ලද අතර මින් ඉදිරියට එවැනි වැරදි සිදුනොවීමට වගබලා ගන්නා බව | ව්‍යාපෘති අධීක්ෂණය හා සැලැසුම් කිරීම මනාව සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රවර්ථන වර්ෂය කුළ සිදුකරන ලද වටිනාකම රු.1,308,800 ක් වූ ප්‍රසම්පාදන අවස්ථා 11 ක් පරීක්ෂා කිරීමේදී මිල කැඳවුම් විවෘත කිරීමේදී ලේකම්වරයා පමණක් අත්සන් කර තිබූ අතර ඒ සඳහා තාක්ෂණික ඇගයීමක්ද සිදු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ප්‍රසම්පාදන කටයුතු විධිමත් කළ යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ අනුමත සේවක මණ්ඩලය හා තථ්‍ය සේවක සංඛ්‍යාව සලකා බැලීමේදී තනතුරු 09 ක පුරප්පාඩු 10 ක් පැවතුණි. | අදාල පුරප්පාඩු පුරවාගැනීමේ දැඩි අවශ්‍යතාවයක් තිබුනද නව පත්වීම් ලබා නොදීමේ රජයේ ප්‍රතිපත්තිමය තීරණය මත බඳවාගැනීම් අත්හිටුවා ඇති බැවින් එම පුරප්පාඩු පුරවාගැනීමට නොහැකි වී ඇති බව | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | නැගෙනහිර පළාත් මූල්‍ය චක්‍රලේඛ PT/03/2021 ට අනුව ඇප තැබිය යුතු නිලධාරීන් 11 දෙනෙකු විසින් ප්‍රමාණවත් පරිදි ඇප තැබීමට කටයුතු කර නොතිබුණි. | 2024 වසරේදී අදාල නිලධාරීන් සියලුදෙනාම ලවා ඇප තැන්පත් කරවීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | වසර ගණනාවකට පෙර නිලධාරීන් 04 දෙනෙකුට ලබාදී තිබූ එකතුව රු.100,146 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර | පිළිගනිමි. ඉදිරි වර්ෂවල සිට ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමට කටයුතු කරන බව | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. |

සමාලෝචිත වර්ෂයට අදාළ අයවැය ලේඛනය මත පදනම්ව ක්‍රියාකාරකම්වල නිරතව තිබුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අභ්‍යන්තර විගණනයන් ක්‍රියාත්මක කර තිබුණද එම අංශය මගින් විගණන හා කළමනාකරණ කමිටු සංවිධානය කිරීම හා පවත්වාගෙන යාම පමණක් සිදු කරන නමුත් විධිමත් විගණන වැඩසටහනකට අනුව ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | අභ්‍යන්තර විගණන විධිමත් කළ යුතුය. |

### 4.3 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 05 ක සියයට 19.83 සිට සියයට 83.25 දක්වාද වියදම් විෂයන් 05 ක සියයට 19.81 සිට සියයට 46.42 ක් දක්වාද විචලනයක් පැවතුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | අයවැය තාත්ත්විකව පිළියෙල කළ යුතුය. |

### 4.4 තිරසර සංවධර්න අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් 2017 අංක 19 දරණ තිරසාර සංවර්ධන පනතේ ඇතුළත් තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා අදාළ නිර්ණායක හඳුනා ගැනීම පිළිබඳ නිසි අවබෝධයක් සමාලෝචිත වර්ෂය තුළදීද ලබාගෙන නොතිබූ නමුත් තිරසර සංවර්ධන ඉලක්ක දෙකක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා අදාළ නිර්ණායක අත්පත් කර ගත යුතුය. |